# යුරෝපා සංගමයේ මැතිවරණ නිරීක්‍ෂණ කමිටුව
# ශ්‍රී ලංකාව 2005

**ශ්‍රී ලංකා ජනරජයේ මැතිවරණ කොමසාරිස් තැන විසින් 2005 ජනාධිපති මැතිවරණය නිරීක්‍ෂණය කිරීමට යුරෝපා සංගමයේ පිහිටුවා ඇති මැතිවරණ නිරීක්‍ෂණ කමිටුවේ ප්‍රධාන නිරීක්‍ෂක මීට පෙර පැවති 2000, 2001 හා 2004 වසර වල පැවැති පාර්ලිමේන්තු මැතිවරණයේ ප්‍රධාන නිරීක්ෂක වශයෙන් කටයුතු කල අයර්ලන්ත ජාතික ජොන් කුෂ්නාන් මහතා පත්කර ඇත.**

ඊට අමතරව ප්‍රධාන නිරීක්‍ෂක ජොන් කුෂ්නාන් මහතාගේ නිරීක්‍ෂක කණ්ඩායමට නියෝජ්‍ය ප්‍රධාන නිරීක්‍ෂක වශයෙන් ප්‍රංශ ජාතික ඩෙල්පින් බිලැන්වට් මහත්මියත්, මැතිවරණ නීති පිලිබඳ ප්‍රවීන ස්පාඤ්ඤ ජාතික ඊඩොන් අරන්සෙටා මහත්මියත්, ප්‍රවීන මාධ්‍ය විශේෂඥ ඉතාලි ජාතික ඇන්ඩ්‍රියා මැල්නටි මහතාත්, නිරීක්‍ෂණ සම්බන්ධීකාරක බ්‍රිතාන්‍ය ජාතික මිගෙල් ඇරැන්ස් මහතාත්, ආරක්ෂක විශේෂඥ ස්පාඤ්ඤ ජාතික ජුආන් ගර්සියා මහතාත් ඇතුලත් වේ.

යුරෝපා සංගමයේ මැතිවරන නිරීක්‍ෂක කණ්ඩයාම ඔක්තොම්බර් මස 23 වන දින සිට මැතිවරණ ක්‍රියා පරිපාටිය අවසන් වන තුරු දිවයිනේ රැඳි සිටිනු ඇත. මෙම කණ්ඩායමට දිර්ඝ කාලින නිරීක්ෂකයින් 22 කින් සමන්විත කණ්ඩායමක් ඔක්තොම්බර් මස 29 වන දින දිවයිනට ලගා වෙන අතර, ඔවුන් රටේ සැම ප්‍රදේශයක්ම ආවරණය වන පරිදි නිරීක්‍ෂනය කරනු ඇත. ඊට අමතරව කෙටි කාලින නිරීක්‍ෂකයින් වශයෙන් 44 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් යුරෝපා සංගමයේ මැතිවරණය නිරීක්‍ෂණ කමිටුවට සම්බන්ධවී ඡන්ද පොල  හා ගනන් කිරීමේ මධ්‍යස්ථාන නිරීක්ෂණය කරනු ඇත.

යුරෝපා සංගමය ලොවපුරා මානව අයිතින් හා ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රවර්ධනය කිරීම මැතිවරණය නිරීක්ෂණ කිරීමෙන් බලාපොරොත්තු වේ. ජාතිකත්වය වර්ධන කිරීමේ අරමුණෙන් ආරාධිත රට සමග සහ සම්බන්ධතාවය මත යුරෝපා සංගමය ක්‍රියාකාරකම්වල යෙදෙයි.

ඡන්ද දායකයින්ගේ විශ්වාසය හා නිදහස් සහභාගිත්වය ශක්තිමක් කරමින් මැතිවරණ නිරීක්‍ෂක කමිටුව මධ්‍යස්ථව හා අපක්ෂපාතිව මැතිවරණ ක්‍රියාදාමය පුළුල්ව විශ්ලේෂණය කර පවත්වා ගෙන යයි.

යුරෝපා සංගමයේ මැතිවරණ නිරීක්‍ෂක කමිටුව මගින් නිත්‍යානුකූල රාමුවක් තුල, මැතිවරණ පරිපාලනය, යහපත් දේශපාලන වතාවරණයක් හා මැතිවරණ ව්‍යාපාරයේදි රජයේ දේපල පරිහරනය කිරිම ද, මැතිවරණ ව්‍යාපාරයේදි මාධ්‍ය හැසිරිම ද ජන්ද පාවිච්චි කිරිම හා ගනන් කිරිම වගු ගත කිරිම ආදිය කටයුතු සම්බන්ධයෙන් පැන නගින් පැමිණිලි හා අභියාචනා පිලිබඳ ජාත්‍යන්තරව පිලිගත් මැතිවරණ නිරීක්‍ෂන ක්‍රියා පිලිවෙතක් අනුව සිදු කෙරේ.

මැතිවරණ පරිපාලන නිලධාරින්, අනෙකුත් මැතිවරණයට සම්බන්ධ බලධාරින්, දේශපාලන පක්ෂ, අපෙක්ෂකයින්, සිවිල් සංවිධාන හා අනිකුත් නිරීක්‍ෂණ කණ්ඩායම් සහ මාධ්‍ය සමග විධිමත්ව සාකච්ජා කරනු ඇත. තවද මැතිවරණ දිනයේදි ඡන්දය පාවිච්චි කිරිම, ගනන් කිරිම සහ වගු ගත කිරිම ආදි ක්‍රියා පරිපාටිය මුළු දිවයින පුරාම බලනපවත්වන පරිදි සිදු කෙරේ.

මැතිවරණයෙන් පසුව යුරෝපා සංගමයේ මැතිවරණ නිරීක්‍ෂණ කණ්ඩායම විසින් මුලින්ම සංෂිප්ත කරුණු සහිත නිරීක්‍ෂණ වාර්ථාවක් මුලික නිරීක්‍ෂණ කටයුතු පිලිබඳ මුළු මහත් මැතිවරණයම ආවරනය වන පරිදි ඉදිරිපත් කරනු ලබන අතර, අවසාන වශයෙන් සම්පුර්ණ වාර්ථාව ආසන්න වශයෙන් මැතිවරණය අවසන් වී මාස දෙකක් ඇතුලත නිකුත් කරනු ඇත. එකි වාර්ථාවට අනාගතයේදි ශ්‍රී ලංකාව තුල ප්‍රජාතන්ත්‍රික වටපිටාවක සාධාරණ මැතිවරණයක් පැවැත්වීය යුතු ආකාරය පිලිබඳ නිර්දේශ සහිත කරුනු ද ඇතුලත් වනු ඇත.

යුරෝපා සංගමයේ මැතිවරණ නිරීක්‍ෂණ කමිටුව, ට්‍රාන්ස්ඒසියා හෝටලය, කොළඹ දුරකථන අංකය (94-11)24-91-000.